සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment

මගේ අංකය எனது இல My No	DSD/HO/05/MF/08/01-චක්‍රලේඛ	ඔබේ අංකය உமது இல Your No	....	දිනය திகதி ... Date	2025.07.08

සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක :- 2025/08

සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු පාලක මණ්ඩල/ බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්,
සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමනාකරුවන්,
සියළුම සමෘද්ධි සංවර්ධන නිළධාරීන් හා සංවර්ධන නිළධාරී(පුරප්පාඩු තනතුරුවල වැඩ බලන)

<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති හා ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලය සඳහා විශේෂ මාසික දීමනාව ලබා ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම් ලබා දීම.</u>

01. හැඳින්වීම

අඩු ආදායම්ලාභී ඇතුළු සමස්ථ ගණුදෙනුකරුවන්ගේ තැන්පතු, ණය ඇතුළු මූල්‍ය සේවා නොපිරිහෙලා ඉටු කර දීම, ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයේ නියුක්ත අනෙකුත් මූල්‍ය ආයතන සමග තරගකාරීව කටයුතුකර සාර්ථකවීම හා ඉලක්ක ගත ජනතාව සවිබලගැන්වීමට අදාළ පහසුකම් සැළසීම වැනි සුවිශේෂ වූ කාර්යයන් බැංකු හා බැංකු සමිති කාර්ය මණ්ඩලය ඉටු කරමින් සිටියි.

වර්තමානයේ පවතින ආර්ථික හා සාමාජීය අර්බුදකාරී තත්ත්වය තුළ තැන්පත් රැස් කිරීම, ණය මුදල් නිදහස් කිරීම හා ණය අය කිරීම සඳහා මහත් වූ පරිශ්‍රමයක් දැරීමට සිදු වී ඇත. එම අභියෝගය ජය ගනිමින් සමෘද්ධි බැංකුව මඟින් ඉටුකරනු ලබන මූල්‍ය සේවා සැපයීම කාර්යක්ෂමව සිදු කිරීමට බැංකු කාර්ය මණ්ඩලය කැපවීමෙන් හා උනන්දුවෙන් කටයුතු කරමින් සිටියි. එබැවින් බැංකු, බැංකු සමිති හා ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයේ උනන්දුව හා අභිප්‍රේරණය ඇති කිරීම සඳහා ඔවුන්ට මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ ලබා දීමට අපේක්ෂා කර ඇත.

ඒ සඳහා වූ මගපෙන්වීමට 2025.06.17 දිනැති අංක **2025/136/06** දරණ සමෘද්ධි බැංකු හා බැංකු සමිති කළමනාකරණ මණ්ඩලය ලබා දුන් අනුමැතිය මත මෙම චක්‍රලේඛය නිකුත් කරමි.

02. මෙම චක්‍රලේඛය නිකුත් කිරීම සමඟ 2024/07/22 නිකුත් කළ 2024/10 චක්‍රලේඛය හා 2024/09/05 නිකුත් කළ 2024/10 ට පළමු එකතුව හා 2024/10/28 නිකුත් කළ දෙවන එකතුව ද අවලංගු කරන බව දන්වමි.

03. මෙම චක්‍රලේඛය ඉහත දීමනා ලබා දීමට අපේක්ෂා කරනුයේ මූල්‍ය ආයතනයක **නිලධාරියෙකු වශයෙන් සේවය කිරීම නිසා, මුහුණදෙන** අවදානමට යම් දීමනාවක් ලබා දීම හා අදාළ නිළධාරියාට බැංකුවේ/ බැංකු සමිතියේ මූල්‍ය සේවා සැපයීම සඳහා දක්වන දායකත්වයේ ප්‍රමාණයට ඇගයීමක් ලෙසිනි.

1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

	අධ්‍යක්ෂ ජනරාල් பணிப்பாளர் தலைமையதிபதி Director General	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) மேலதிக பணிப்பாளர் தலைமையதிபதி (நிர்வாகம்/தாபனம்) Additional Director General (Admin & Establishment)	ප්‍රධාන ගණකාධිකාරී பிரதான கணக்காளர் Chief Accountant	අධ්‍යක්ෂ)ක්ෂුද්‍ර මූල්‍ය) பணிப்பாளர் (குறு நிதி) Director (Micro Finance)	කාර්යාලය அலுவலகம் Office
Tel-	011-2869824	011-2873799	011-2869742	011-2889003	0112872202
Fax -	011-2889002	011-2873996	011-2869742	011-2887469	
E-mail-	dgsamurdhi@gmail.com	diradmin@samurdhi.gov.lk	finance@samurdhi.gov.lk		
		Hot Line :0112-889007		**Hot Line:0112-885582**	**Hot Line: 011- 2887722**

04. **සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා ක්ෂේත්‍ර කාර්යමණ්ඩලවලට දිරි දීමනා ලබා දීම**

මෙම අවදානම් දීමනාව ලබා ගැනීමේ දී 2025 ජූනි මාසයේ සිට පහත උපදෙස් අනුගමනය කළ යුතුය.

4.1. මූල්‍ය ක්ෂේත්‍රයේ රාජකාරී ඉටු කිරීම නිසා මුහුණ දෙනු ලබන අවදානම සළකා, ලබා දෙන නිත්‍ය මාසික දීමනාව:

කළමනාකරු	රු. 7,500/=	
සහකාර කළමනාකරු	රු. 6,000/=	
පොත් තබන්නා/ගිණුම් ලිපිකරු I හා II/ මුදල් අයකැමි(භාරකරු)	රු. 4,500/=	බැගින්
කලාප/ක්ෂේත්‍ර සහකාර	රු. 3,000/=	
ක්ෂේත්‍ර නිලධාරී	රු. 2,400/=	බැගින්

4.1.1. කිසියම් බැංකුවක් සලකා බලන වර්ෂයට පෙර වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 2 ට වැඩි ලාභයක් ලබා ඇත්නම් ඉහත සම්පූර්ණ දීමනාව ලබා ගත හැක.

4.1.2. කිසියම් බැංකුවක් සලකා බලන වර්ෂයට පෙර වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 02 හා රුපියල් මිලියන 2 ට අඩු ලාභයක් ලබා ඇත්නම් ලබාගත හැක්කේ නිත්‍ය දීමනාවෙන් අඩක් පමණි.

4.1.3. කිසියම් බැංකුවක් අලාභ ලබා ඇත්නම් හා එම අලාභය රුපියල් මිලියන 01 ට වඩා අඩුනම් ලබාගත හැක්කේ නිත්‍ය දීමනාවෙන් තුනෙන් එකක් පමණි.

4.1.4. අලාභය රුපියල් මිලියන 01 හෝ ඊට වඩා වැඩි විට කිසිදු දීමනාවක් හිමි නොවේ.

4.1.5. අලාභ ලබන බැංකු සඳහා මෙම දිමනා ලබාගත හැක්කේ 2025 වසර තුළ පමණි. මෙයට අමතරව මෙම චක්‍රලේඛයේ 6–XII පිළිබඳ අවධානය යොමුකර නිළධාරීන් දැනුවත් කළ යුතුය.

4.2 **උපයා ගැනීම සඳහා වන නිර්ණායක**

4.2.1 බැංකුව විසින් උපයා ඇති මෙහෙයුම් ශුද්ධ ලාභය (a නම්) අනුව දිරි දීමනා ලැබෙන ආකාරය පහත පරිදි වේ. මෙම දීමනා බැංකු කාර්යමණ්ඩලය, ක්ෂේත්‍ර සහකාර හා ක්ෂේත්‍ර නිළධාරී යන සියළුම නිළධාරීන්ට අදාළ කර ගත යුතුය.

I.	රු.මි. 5 ≤ a<10 නම්	රු. 500/=
II.	රු.මි.10 ≤ a<15 නම්	රු.1,000/=
III.	රු.මි.15 ≤ a<20 නම්	රු.1,500/=
IV.	රු.මි.20 හෝ ඊට වැඩි නම්	රු.2,000/=

4.2.2 **තැන්පත් වලට පිටිහිටි ණය අනුපාතය**

4.2.2.1 **බැංකු කාර්යමණ්ඩලයට හා ක්ෂේත්‍ර සහකාරට ගෙවීම්**

මෙම අනුපාතය ගණනය කිරීමේ දී බැංකුවේ සියලුම තැන්පත් අක්‍රීය හා සක්‍රීය එකතුව ද (අනිවාර්ය ඉතිරි, ධනශක්ති, ස්ථාවර තැන්පත් ඇතුළුව) සහ පාරිභෝගික ණය සඳහා රඳවාගත් 60% සමූහ සංරක්ෂණ අරමුදල් ගිණුම (4015), ග්‍රාමීය ණය අවශ්‍යතා පිරිමසාගැනීමේ අරමුදල් ගිණුම (4033), ජීවනෝපාය සංවර්ධන චක්‍රීය ණය අරමුදල සඳහා ලබා ගත් අරමුදල් ගිණුම (4041), අත්හැර දමන ලද තැන්පත් ගිණුම (4057), හිමිකම් නොපෑ / අනිවාර්ය ඉතුරුම් ගිණුම (4059) යන ගිණුම් වල එකතුව මුළු තැන්පත් ලෙස සැලකිය යුතුය. පිටිහිටි ණය ලෙස, ලැ/යු ණය පාරිභෝගික ගිණුම (3104) හා ලැ/යු ජීවනෝපාය චක්‍රීය ණය ගිණුම (3113), බැංකු සමිතිය සඳහා ලබා දුන් සේවක ප්‍රතිමූල්‍ය ණය ගිණුම (3191), බැංකු/බැංකු සමිති ගොඩනැගිලි ඉදිකිරීමට

බැංකු සමිතියට ලබාදුන් ණය ගිණුම (3192) ද ඇතුළුව සියලුම පිටහිටි ණය ශේෂයන් සැලකිය යුතුය. පිටහිටි ණය මුදල b ලෙස ගතහොත්

I. තැන්පතු පිටිහිටි ණය අනුපාතය 40.00% - 59.99 % හා
පිටහිටි ණය මුදල මිලියන 75 ≤ b < 100 අතර නම් දීමනාව රු. 500/= කි.

II. තැන්පතු පිටිහිටි ණය අනුපාතය 60.00% - 79.99% හා
පිටහිටි ණය මුදල මිලියන 100 ≤ b < 150 අතර නම් දීමනාව රු.1,000/= කි.

III. තැන්පතු පිටිහිටි ණය අනුපාතය 80.00% - 89.99% හා
පිටහිටි ණය මුදල මිලියන 150 ≤ b < 200 ට අතර නම් දීමනාව රු.1,500/= කි.

IV. තැන්පතු පිටිහිටි ණය අනුපාතය 90% හෝ ඊට වැඩි නම් හා
පිටහිටි ණය මුදල මිලියන 200 හෝ ඊට වැඩිනම් දීමනාව රු.2,000/= කි.

4.2.2.2 **ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයට ගෙවීම්**

ක්ෂේත්‍ර කාර්යමණ්ඩලයට දිරි දීමනා ලබා දීමේ දී පහත ආකාරයෙන් කටයුතු කළ යුතුය. එහිදී පිටහිටි ණයට තැන්පත් අනුපාතය වසම් මට්ටමට ගණනය කිරීමේ දී පොදු ලෙජරයේ කේත අංක 4015, 4033, 4041, 4057, 4059 යන පොදු ලෙජර ගිණුම්වල ශේෂයන්ගේ මුළු එකතුව වසම් ගණනින් බෙදා ලැබෙන ශේෂය වසමේ තැන්පතු වලට එකතු කර තැන්පතු අගය ගණනය කළ යුතුය.

මෙම චක්‍රලේඛය අනුව තැන්පත් පිටහිටි ණය අනුපාතය ගණනය කරන සෑම අවස්ථාවක දීම මෙලෙස ගණනය කළ යුතුය. පිටහිටි ණය මුදල "c" ලෙස ගත් විට,

i. තැන්පතු පිටිහිටි ණය අනුපාතය 40.00% - 59.99 % ත් හා
පිට හිටි ණය මුදල මිලියන 7.5 ≤ c <10 නම් දීමනාව රු. 500/= කි.

ii. තැන්පතු පිටිහිටි ණය අනුපාතය 60.00% - 79.99% ත් හා
පිට හිටි ණය මුදල මිලියන 10 ≤ c < 15 නම් දීමනාව රු.1,000/= කි.

iii. තැන්පතු පිටිහිටි ණය අනුපාතය 80.00% - 89.99% ත් හා
පිට හිටි ණය මුදල මිලියන 15 ≤ c < 20 නම් දීමනාව රු.1,500/= කි.

iv. තැන්පතු පිටිහිටි ණය අනුපාතය 90.00% හෝ ඊට වැඩි නම් හා
පිට හිටි ණය මුදල මිලියන 20 හෝ ඊට වැඩිනම් දීමනාව රු.3,000/= කි.

4.2.2.3 **නිර්ණායක දෙකම එකවර තෘප්ත නොවන විට දීමනා ලබා ගැනීම**

4.2.2.1 හා 4.2.2.2 යන අවස්ථාවල දීමනා ගෙවීම පිළිබඳ සලකා බැලීමේ දී ඒ ඒ අවස්ථාවල ලබා දී ඇති නිර්ණායක ද්විත්වයම (දෙකම) එකවර සම්පූර්ණ වී නොමැති නම් සම්පූර්ණ වන අවම අවස්ථාව පදනම් කරගෙන එම අවම අවස්ථාව නිරූපනය වන දීමනාව ලබාගත යුතුය.
උදාහරණ:- සමෘද්ධි බැංකුවක් මිලියන 210 ක පිටහිටි ණය මුදලක් හා 62.01% ක ණය-තැන්පතු අනුපාතයක් පවත්වාගෙන යන්නේ නම් එම බැංකුවට හිමි දීමනාව රු. 1,000 කි. ක්ෂේත්‍ර නිළධාරී දීමනා ගෙවීමද ඒ ආකාරයෙන් ම විය යුතුය.

4.2.3 අක්‍රීය ණය (Non Performing Loans)

මෙම දීමනාව ලබා ගැනීමට සමෘද්ධි බැංකුවක් තම පිටහිටි ණය මුදල මිලියන 100 ට වැඩිවිය යුතු හා තැන්පත් පිටහිටි ණය අනුපාතය 60% ට වැඩි විය යුතුය. මෙම කොන්දේසි 02 එකවර සම්පූර්ණ නම් බැංකු කාර්ය මණ්ඩලයට (ක්ෂේත්‍ර සහකාර ද ඇතුළුව) පහත පරිදි දීමනා ලබා දිය හැක.

ක්ෂේත්‍ර කාර්යමණ්ඩලයට මෙම දිරි දීමනා ලබා දීමේ දී පිටහිටි ණය මුදල රුපියල් මිලියන 10 ට වැඩිවිය යුතු හා තැන්පත්-පිටහිටි ණය අනුපාතය 60% ඉක්මවිය යුතුය යන කොන්දේසි දෙකම එකවර සම්පූර්ණ කර තිබිය යුතුය.

I. අක්‍රිය ණය අනුපාතය 2.01% - 3.00% ක් නම් රු.500/=
II. අක්‍රිය ණය අනුපාතය 1.01% - 2.00% ක් නම් රු.1000/=
III. අක්‍රිය ණය අනුපාතය 0.01% - 1.00% ක් නම් රු.1500/=
IV. අක්‍රිය ණය අනුපාතය 0% ක් නම් රු.2000/=
V. අක්‍රිය ණය අනුපාතය 3.01% - 10.00% නම් මුදලක් එකතු හෝ අඩු නොවේ
VI. අක්‍රිය ණය අනුපාතය 10.01% - 15.00% නම් (රු.500/=)
VII. අක්‍රිය ණය අනුපාතය 15.01%ක් - 20.00% අතර (රු.1000/=)
VIII. අක්‍රිය ණය අනුපාතය 20.01% හෝ ඊට වැඩි නම් (රු.2000/=)

සියළු තැන් හී වරහන් තුළ (උදා. ඉහත VI,VII.VIII) දක්වා ඇත්තේ සෘණ ඉපැයීම් ය. මෙම සෘණ ඉපැයුම් මුදල යනු තමන් උපයා ගන්නා ලද මුදලින් අඩු කළ යුතු අගයකි. ඉපැයීම් වලින් සෘණ අගයන් අඩුකළ ද එම අඩුකිරීම් අවදානම් දීමනාවට බලපෑමක් සිදු නොවිය යුතුය. ඒනම් 4.1 හි ඇති අවදානම් දීමනාව අඩු නොකොට ගෙවිය යුතුය.

4.2.4 කල්පසු වූ ණය අනුපාතය ගණනය කිරීම මත ගෙවන අතිරේක දීමනාව

මෙම දීමනාව ලබා ගැනීමට සමෘද්ධි බැංකුවක් තම පිටහිටි ණය මුදල මිලියන 100 ට වැඩිවිය යුතු හා තැන්පත් පිටහිටි ණය අනුපාතය 60% ට වැඩි විය යුතුය. මෙම කොන්දේසි ද්විත්වය එකවර සම්පූර්ණ නම් බැංකු කාර්යමණ්ඩලයට (ක්ෂේත්‍ර සහකාර ද ඇතුළුව) පහත පරිදි දීමනා ලබා දිය හැක.

ක්ෂේත්‍ර කාර්යමණ්ඩලයට මෙම දිරි දීමනා ලබා දීමේ දී ක්ෂේත්‍ර නිළධාරියෙකුගේ තම පිටහිටි ණය මුදල රුපියල් මිලියන 10 ට වැඩිවිය යුතු හා තැන්පත්-පිටහිටි ණය අනුපාතය 60% ඉක්මවිය යුතුය.

කල්පසු ණය ගණනය කිරීමේ දී කල්ඉකුත්(Time Expired) වූ ණය මුදල් ඇත්නම් ඒවා ද කල්පසු ණය මුදලට එකතු කළ යුතුය. මෙහිදී වාරික 03 - 08 අතර වාරික ප්‍රමාණයක් ගෙවීම් පැහැර හැරී ණය වල එකතුව පිටිහිටි මුදලට අනුපාතයක් ලෙස ගණනය කළ යුතුය. මෙම අනුපාතය,

I. 0.00% නම් රු.1,500/=
II. 0.01% - 5.00% නම් රු.1,000/=
III. 5.01% - 10.00% නම් රු. 500/=
IV. 10.01% - 15.00% නම් මුදලක් එකතු හො අඩු නොවේ
V. 15.01% - 20.00% නම් (රු.500/=)
VI. 20.01% ට වැඩි නම් (රු.1,500/=)

මෙම අනුපාතය වසම් මට්ටමට හා කලාප මට්ටමට ගණනය කළ යුතුය.

4.2.5 තැන්පතු වර්ධනය මත ගෙවන අතිරේක දීමනාව

මෙම අනුපාතය පෙර වර්ෂයේ දෙසැ 31 ට අනිවාර්ය ඉතිරි හැර තැන්පතු වල සක්‍රීය හා අක්‍රීය එකතුවල සමුච්චිත වටිනාකම (A) පාදක වර්ෂය ලෙස ගෙන හා දීමනා ලබන මාසයේ අනිවාර්ය ඉතිරි හැර අනෙකුත් සියළුම තැන්පත් වල සක්‍රීය හා අක්‍රීය එකතුවල සමුච්චිත වටිනාකම (B) ලෙස ගෙන, එම B - A අතර වෙනස පාදක වර්ෂයේ (A) වටිනාකමින් බෙදා ප්‍රතිශතයක් ලෙස ගණනය කළ යුතුය.

- මෙහිදී සමුච්චිත අගය මත ගණනය කිරීම් කළ යුතුය.

$$\frac{B - A}{A} \times 100 \times \frac{12}{\text{මාස ගණන}}$$

මාසිකව ගණනය කිරීම

$$\frac{B - A}{A} \times 100 \times \frac{12}{1,2,3,4,5,6,7,8,9,10,11,12}$$

මාස -1

$$\frac{B - A}{A} \times 100 \times \frac{12}{1}$$

මාස 6

$$\frac{B - A}{A} \times 100 \times \frac{12}{6}$$

මාස -10

$$\frac{B - A}{A} \times 100 \times \frac{12}{10}$$

මාස -12

$$\frac{B - A}{A} \times 100 \times \frac{12}{12}$$

මාසය	1% මාසික වර්ධනය	3% මාසික වර්ධනය	5% මාසික වර්ධනය	10%මාසික වර්ධනය
ජනවාරි	0.08	0.25	0.42	0.83
පෙබරවාරි	0.17	0.5	0.83	1.67
මාර්තු	0.25	0.75	1.25	2.50
අප්‍රේල්	0.33	1	1.67	3.33
මැයි	0.42	1.25	2.08	4.17
ජුනි	0.5	1.50	2.50	5
ජුලි	0.58	1.75	2.92	5.83
අගෝස්තු	0.67	2	3.33	6.67
සැප්තැම්බර්	0.75	2.25	3.75	7.50
ඔක්තෝම්බර්	0.83	2.5	4.17	8.33
නොවැම්බර්	0.92	2.75	4.58	9.17
දෙසැම්බර්	1	3	5	10

වසමේ තැන්පතු ගණනයේ දී පොදු ලෙජරයේ 4057 හි ශේෂය, වසම් ගණනින් බෙදා, ලැබෙන අගය වසමේ තැන්පත් ශේෂයට එකතු කර වසමේ මුළු තැන්පත් වටිනාකම ගණනය කළ යුතුය.

ඒ අනුව වාර්ෂික තැන්පත් වර්ධන ප්‍රතිශතය,

I. 1.00% - 2.99% අතර රු. 500/=

II. 3.00% - 4.99% අතර රු. 1,000/=

III. 5.00% - 9.99% අතර රු. 1,500/=

IV. 10.00% හෝ ඊට වැඩි නම් රු. 2,000/=

ඒ අනුව පහත සදහන් වාර්ෂික තැන්පත් වර්ධන ප්‍රතිශතය මත දීමනා ලබාගත හැකිය. ඉහත වාර්ෂික තැන්පතු වර්ධනය මාසිකව ගණනය කිරීමේදී ඉහත වගුව අධාරයෙන් මාසික වර්ධනය ගණනය කර දීමනා ලබා ගත යුතුය.

උදාහරණ:- 2025 මැයි මාසයේ තැන්පත් වර්ධන ප්‍රතිශතය ගණනය කිරීමේදී ලැබෙන පිළිතුර 1.25 නම් ලබාගත හැකි දීමනාව රුපියල් 1,000.00 කි. වර්ධන ප්‍රතිශතය 2.08 නම් ලබාගත හැකි දීමනාව 1500.00කි. වර්ධන ප්‍රතිශතය 4.17 නම් ලබාගත හැකි දීමනාව රුපියල් 2000.00 කි.

4.2.6 **ක්ෂේත්‍ර නිළධාරී විශේෂ දීමනාව**

සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල ප්‍රගමණයේ දී ක්ෂේත්‍ර නිළධාරීන් විශේෂ රාජකාරියක් ඉටුකරන අතර, බැංකුව වෙනුවෙන් වගකීම් ද දරනු ලබයි. එබැවින් **ක්ෂේත්‍ර නිළධාරීන්ට පමණක්** වන සේ පහත ආකාරයෙන් විශේෂ දීමනාවක් ලබා දීම සිදු කෙරේ.

නිර්ණායක:-

- පිටහිටි ණය මුදල මිලියන 40 ට වැඩි
- කල්පසු ණය අනුපාතය 5% හෝ ඊට අඩු
- අක්‍රීය ණය (NPL) අනුපාතය 3% හෝ ඊට අඩු

මාසික දීමනාව:-

4.2.2.2 (iv)පරිදි උපරිම ලබාගත හැකි දීමනාව රු. 3000 කි. පිටහිටි ණය මුදලට අදාළ දීමනාවට අමතර වශයෙන් පහත දීමනාව ගෙවීම් කළ යුතුය. පිටහිටි ණය මුදල d නම්,

I. මිලියන 30 ≤ d < 40 නම් 1,000/-

II. මිලියන 40 ≤ d < 50 නම් 2,000/-

III. මිලියන 50 ≤ d <60 නම් 3,000/-

IV. මිලියන 60 හෝ ඊට වැඩි 5,000/-

4.2.7 නිලධාරියෙකුට ලබා ගත හැකි උපරිම මාසික දීමනාව

කළමනාකරු	රු.17,000/=
සහකාර කළමනාකරු	රු.15,500/=
පොත් තබන්නා ගිණුම් ලිපිකරු 1 ගිණුම් ලිපිකරු 2 මුදල් භාරකරු	රු.14,000/= බැගින්
කලාප සහකාර	රු.12,500/=
ක්ෂේත්‍ර නිලධාරීන්ට	රු.17,900/= බැගින්

05. බැංකු සමිති සඳහා දිරි දීමනා ලබා දීම

5.1 මූල්‍ය ආයතනයක රාජකාරි ඉටු කිරීම නිසා **මුහුණ දෙන අවදානම වෙනුවෙන්** ලබා දෙන නිත්‍ය දීමනාව

කළමනාකරු	රු. 8,100/=
සහකාර කළමනාකරු	රු. 6,600/=
ව්‍යාපෘති කළමනාකරු	රු. 6,600/=
අනෙකුත් කාර්යය මණ්ඩලය	රු. 4,200/= බැගින් එක් නිලධාරියෙකුට

(සැ/යු:- ආයතන සහකාර, ගිණුම්/මුදල් සහකාර, ව්‍යාපෘති සහකාර, සමාජ සංවර්ධන නිලධාරීන් යන නිළධාරීන් අනෙකුත් කාර්යමණ්ඩලය ලෙස අදාළ කර ගත යුතුය.)

5.1.1 කිසියම් බැංකු සමිතියක් සලකා බලනු ලබන වර්ෂයට පෙර වර්ෂයේ මිලියන 02 හෝ ඊට වැඩි ලාභයක් ලබා ඇත්නම් ඉහත සම්පූර්ණ නිත්‍ය දීමනාව ලබාගත හැක.

5.1.2 කිසියම් බැංකු සමිතියක් සලකා බලනු ලබන වර්ෂයට පෙර වර්ෂයේ රුපියල් මිලියන 02 ට අඩු ලාභයක් ලබා ඇත්නම් හිමිවන්නේ මෙම නිත්‍ය දීමනාවෙන් අඩක් පමණි.

5.1.3 කිසියම් බැංකු සමිතියක් සලකා බලනු ලබන වර්ෂයට පෙර වර්ෂයේ රුපියල් මිලියනයකට අඩු අලාභයක් ලබා ඇත්නම් හිමිවන්නේ මෙම නිත්‍ය දීමනාවෙන් තුනෙන් එකක් පමණි.

5.1.4 අලාභ ලබන බැංකු සමිති සඳහා මෙම නිත්‍ය දීමනාව ලබාගත හැක්කේ 2025 වසර තුළ පමණි.

5.2 අලාභය මිලියන එක හා එකකට වඩා වැඩිනම් නිත්‍ය දීමනා හිමි නොවේ. නමුත් එවැනි බැංකු සමිති වලටද උපයාගැනීම් නිර්නායක සම්පූර්ණ කර ඇත්නම් එවැනි අවස්ථාවල දී ඒ ඒ නිර්නායකයට හිමි දීමනාවල එකතුව ලබා ගත හැක.

5.3 උපයා ගැනීම සඳහා වන නිර්ණායක,

5.3.1 බැංකු සමිතිය උපයා ගත් මෙහෙයුම් ශුද්ධ ලාභය අනුව (ශුද්ධ ලාභය e නම්),

I.	රු මිලියන $5 \leq e < 10$ නම්	රු.1,000/=
II.	රු මිලියන $10 \leq e < 15$ නම්	රු.1,500/=
III.	රු මිලියන $15 \leq e < 20$ නම්	රු.2,500/=
IV.	රු මිලියන 20 හෝ ඊට වැඩි නම්	රු.3,500/=

5.3.2 **පිටහිටි ණය මුදල අනුව (ණය මුදල f නම්) ගෙවන අතිරේක දීමනාව**

I.	මිලියන $50 \leq f < 75$ නම්	රු. 500/= කි.
II.	මිලියන $75 \leq f < 100$ නම්	රු.1000/= කි.
III.	මිලියන 100 හෝ ඊට වැඩි නම්	රු.1500/= කි.

5.3.3 අක්‍රීය ණය (Non Performing Loan) මත ගෙවන අතිරේක දීමනාව

මෙම දීමනාව ලබා ගැනීමට පිටහිටි ණය මුදල රුපියල් මිලියන 75 ට වැඩි විය යුතුය. එසේ වුව ද අක්‍රීය ණය අනුපාතය වැඩි වීමෙන් සෘණ මුදල් දීමනා ලෙස ගණනය වේ නම් ඒවා උපයාගත් දීමනා මුදල් වලින් අඩුකළ යුතුය.

I.	අක්‍රීය ණය අනුපාතය 2.01% - 3.00% නම්	රු. 500/=
II.	අක්‍රීය ණය අනුපාතය 1.01% - 2.00% නම්	රු.1,000/=
III.	අක්‍රීය ණය අනුපාතය 0.01% - 1.00% නම්	රු.1,500/=
IV.	අක්‍රීය ණය අනුපාතය 0% නම්	රු.2,000/=
V.	අක්‍රීය ණය අනුපාතය 3.01% -10.00% නම්	මුදලක් එකතු හෝ අඩු නොවේ
VI.	අක්‍රීය ණය අනුපාතය 10.01% - 15.00% නම්	(රු.500/=)
VII.	අක්‍රීය ණය අනුපාතය 15.01% - 20.00% නම්	(රු.1000/=)
VIII.	අක්‍රීය ණය අනුපාතය 20.01% ට වැඩි නම්	(රු.1500/=)

VI,VII,VIII හී වරහන් තුළ පෙන්වා ඇති සෘණ ඉපැයීම් මුදල්, තමන් සත්‍ය වශයෙන් උපයා ගන්නා ලද මුදල් වලින් අඩු කළ යුතුය. නමුත් සැමවිටම සෘණ ඉපැයීම් වැඩිවන විට අවදානම් දීමනාව කපා හැරීම නොකළ යුතුය.

5.3.4 කල්පසු ණය අනුපාතය මත ගෙවන අතිරේක දීමනාව

මෙම දීමනාව ලබා ගැනීමට පිටහිටි ණය මුදල මිලියන 75 ට වඩා වැඩි විය යුතුය.
මෙම අනුපාතය ගණනය කිරීමේ දී වාරික 03 ක් හෝ 03 ට වැඩි වාරික ප්‍රමාණයක් ආපසු ගෙවීම් පැහැර හැර ඇති ණය වල පිටිහිටි මුදල, කල්පසු ණය මුදල ලෙස සැලකිය යුතුය.

කල්පසු ණය අනුපාතය

I.	0.00% නම්	රු.1,500/=
II.	0.01% - 5.00% නම්	රු.1,000/=
III.	5.01% - 10.00% නම්	රු. 500/=
IV.	10.01% - 15.00% නම්	මුදලක් එකතු හෝ අඩු නොවේ
V.	15.01% - 20.00% නම්	(රු. 500/=)
VI.	20.01% ට වැඩි නම්	(රු.1,000/=)

5.4 **බැංකු සමිති නිලධාරියෙකුට ලබා ගත හැකි උපරිම මාසික දීමනාව,**

කළමනාකරු	රු.16,600/=
සහකාර කළමනාකරු	රු.15,100/=
ව්‍යාපෘති කළමනාකරු	රු.15,100/=
අනෙකුත් කාර්යය මණ්ඩලය	රු.12,700/= බැගින්

06. මෙම දීමනා ලබා ගැනීමේ දී පහත කරුණු සැළකිය යුතුය.

I. දැනට සමෘද්ධි බැංකු හා බැංකු සමිති සඳහා අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන්ට (Development officers) මෙම දීමනාව හිමි නොවේ. නමුත් නිත්‍ය කාර්යය මණ්ඩල සාමාජිකයෙකුගේ පුරප්පාඩුවක් වෙනුවෙන් සංවර්ධන නිලධාරියෙකු වැඩ බැලීමට/රාජකාරී ආවරණයට පත් කර ඇති විටක නිත්‍ය සාමාජිකයාට හිමි දීමනාව මෙම නිලධාරියාට හිමිවේ.

II. යම් නිලධාරියෙකු නිත්‍ය තනතුරට අමතරව යම් තනතුරක වැඩ බලන විටක අදාළ සුදුසුකම් සම්පූර්ණ කර ඇත්නම් ඔහු/ඇයට දීමනාව ලබා දිය යුතුය. නමුත් එකවර තනතුරු එකට වඩා වැඩ බලන විටක නිත්‍ය තනතුරට අමතරව එක් වැඩ බලන තනතුරකට පමණක් මාසික දීමනාව ගෙවීමට ඉඩ දෙනු ලැබේ.

III. යම් නිලධාරියෙකුට මෙම මාසික දීමනාව ලැබීමට නම් අවම වශයෙන් ලිත් මසක කාලයක් අදාළ සේවා ස්ථානයේ සේවය කර තිබිය යුතුය.

IV. යම් නිලධාරියෙකු සම්බන්ධව මූලික පරීක්ෂණයක්/විනය පරීක්ෂණයක් සිදු කරන විටක ඔහු/ඇය මාසික දීමනා ලබා ගැනීමට සුදුසුකම් නොලබන අතර ඉදිරි දිනක චෝදනා වලින් නිදහස් වූ විටක නොගෙවූ මාසවලට අදාළ අවදානම් දීමනා ලබා දීම සඳහා දිස්ත්‍රික් අධ්‍යක්ෂකගේ අනුමැතිය ලබාගත යුතුය. එසේම ඉහත පරීක්ෂණ තත්ත්වය නිසා වෙනත් නිලධාරියකු අදාළ රාජකාරියට අනුයුක්ත කොට මාසික දීමනා ගෙවා ඇත්නම් එම කාලයට අදාළව පරීක්ෂණයට භාජනය වූ නිලධාරියාට දීමනා සඳහා හිමිකම් පෑමට නොහැක.

V. බැංකු හා බැංකු සමිති කාර්යය මණ්ඩලය මෙම දීමනාව ලබා ගැනීමට නම් සමෘද්ධි බැංකු ගිණුම් ක්‍රියාවලිය නිවැරදිව අනුගමනය කළ යුතුය. එනම් Manual ඉවත් කළ බැංකු Manual ඉවත් කිරීමෙන් පසු ගණුදෙනු පවත්වා ගෙන යා යුතු ආකාරයට (2023.10.03 නිකුත් කළ 2023/07 චක්‍රලේඛය අනුව) ද, Manual ඉවත් නොකළ බැංකු Manual ඉවත් කිරීමට ඉල්ලීම් කර තිබිය යුතුය. බැංකු Manual හා පරිගණක පද්ධති ගිණුම් යන දෙකම මෙහෙයුම් උපදෙස් අනුව පවත්වාගෙන යා යුතුය.

VI. සමෘද්ධි බැංකු මෙම දීමනා ලබා ගැනීම සඳහා සෑම මාසයකම 05 වෙනිදාට පෙර ප්‍රගති වාර්තා සකස් කර මූලස්ථානයට/බැංකු සමිතියට යැවිය යුතු අතර, බැංකු සමිති විසින් සෑම මාසයක් අවසානයේදී ම එළඹෙන 10 වෙනිදාට හෝ ඊට පෙර සමෘද්ධි බැංකු ණය, තැන්පතු, ආයෝජන හා ශේෂ පරීක්ෂණය (තුළනය වූ) පිළිබඳ ප්‍රගති වාර්තා දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලට ලබා දී තිබිය යුතුය. තවද බැංකු සමිති විසින් මාසිකව ණය හා සමූහ සංරක්ෂණ තත්ත්ව වාර්තා සකස් කර තිබිය යුතුය.

VII. බැංකු හා බැංකු සමිති මාසයක් තුළ ලද විගණන විමසුම් වලට පිළිතුරු දින 14 ක් ඇතුළත ලබා දී තිබීම.

VIII. සමෘද්ධි බැංකු සමිති ආයෝජන සඳහා සමෘද්ධි බැංකුව මඟින් ලැබෙන අරමුදල් දින 03ක් ඇතුළත (චෙක්පතක් නම් උපලබ්දි වූ දින සිට) ආයෝජනය කළ යුතු අතර, කල්පිරුණු ආයෝජන බැංකුවේ ඉල්ලීම් පරිදි කටයුතු කර තිබීම හා පොළී නිවේදනය දින 05 ක් තුළ බැංකුව වෙත යොමු කිරීම

IX. චක්‍රලේඛ උපදෙස් අනුව බැංකුවේ හා බැංකු සමිතියේ ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා තිබිය යුතුය.

X. යම් සමෘද්ධි බැංකුවක්/බැංකු සමිතියක් තමන්ට පාලනය කරගත නොහැකි කාරණයක්/ කාරනා නිසා දිගින් දිගටම අලාභ ලබන්නේ නම් එම ආයතනවලට නිත්‍ය දීමනාව ලබාගැනීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය අධ්‍යක්ෂකගේ පූර්ව අනුමැතිය සෑම මාස හයකට වරක්ම ලබාගත යුතුය.

XI. ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලය ලෙස සැලකිය යුත්තතේ ග්‍රාමසේවා වසමක ක්ෂේත්‍ර නිලධාරියා පදනම් කරගත යුතුය. මෙම චක්‍රලේඛයේ දීමනා ලබා ගැනීමට නම් කලාපයේ සියළුම වසම් ආවරණය වන පරිදි සක්‍රීය සේවයේ නියුතු නිලධාරීන් විසින් රාජකාරී ඉටුකළ යුතුය.

XII. **2025.12.31 දක්වා උපයාගැනීම් දීමනා කිසිවකට සුදුසුකම් නොලබන බැංකු/ බැංකු සමිති හා වසම්භාර ක්ෂේත්‍ර නිළධාරීන් සඳහා 2026 වර්ෂයේ සිට ලාභය පදනම් කරගෙන ගෙවනු ලබන අවදානම් දීමනාවෙන් ගෙවීමට අනුමත කරන්නේ 25% ක මුදලක් පමණි.**

XIII. බැංකු සමිතියක ව්‍යාපෘති කළමනාකරු තනතුරට අදාළව නිළධාරීන් එක් අයකුට වඩා වැඩි නිළධාරී සංඛ්‍යාවක් රාජකාරී ඉටුකළ ද, හිමිවන්නේ එක් දීමනාවක් පමණි.

XIV. මෙම දීමනා චක්‍රලේඛය අනුව මාසික දීමනා ගණනය කිරීමේ දී ඒ සඳහා සකස් කර ඇති Ms.Excel ආකෘතිය භාවිතයට ගැනීම අනිවාර්යය වේ. මෙම Ms.Excel ආකෘතිය හැර වෙනත් ආකාරයකට දීමනා ගණනය කිරීම නොකළ යුතුය. එසේම මෙම Ms.Excel ආකෘතිය සම්පූර්ණ කිරීමට යොදාගන්නා තොරතුරු, පරීක්ෂා කිරීමට බැංකුවට පැමිණෙන නිළධාරීන්ගේ පරීක්ෂාව සඳහා මාසිකව විධිමත් ආකාරයට ගොනුකර තැබිය යුතුය.

උදා: ව්‍යාපෘති කළමනාකරු ගෙවීම් කිරීමේ දී ඇමුණුම-03 ආකෘතිය හා ඡේද 7.1 සඳහන් තොරතුරු අමුණා තැබිය යුතුය.

07. **බැංකු සමිතියක රාජකාරී කරන නිලධාරීන් ප්‍රධාන නිර්ණායක සම්පූර්ණ කළ ද පහත සඳහන් කරුණු සම්පූර්ණ කළ යුතුය.**

7.1 ව්‍යාපෘති කළමනාකරු

I. මාසය තුළ සමෘද්ධි බැංකුවට ලද රු.500,000/= ට වැඩි ණය ඉල්ලුම්පත්‍ර වලට අදාළ ව්‍යාපෘති වාර්තා හා බැංකු සමිතියට ලද ණය ඉල්ලුම් පත්‍රවලට අදාල ව්‍යාපෘති වාර්තා සකස් කිරීම, ඇගයීම් කිරීම, නිර්දේශ ලබා දීම, පෙර හා පසු විපරම් කිරීම

II. ජීවනෝපාය ව්‍යාපෘති ආරම්භ කිරීමට සහය වීම

III. පවුල් සවිබල ගැන්වීමේ ජාතික වැඩසටහනට අදාළව ව්‍යපෘති සකස් කිරීම සහය සේවා ආයතන සමග වැඩසටහන් සංවිධානය කිරීම

IV. සෑම මාසයකම කල්පසු ණය 25 ක් හා බොල්ණය 5 ක් අධීක්ෂණය කිරීම හා කලාපය, ණයකරුගේ නම, ලිපිනය, ගිණුම් අංකය සහිතව නිරීක්ෂණ දිනට ප්‍රගතිය ඇතුළත්ව, සකස් කළ වාර්තාව මෙම දීමනාව අයදුම්කරන ඇමුණුම-3 ආකෘතියට අමුණා තැබිය යුතුය.

7.2 ව්‍යාපෘති සහකාර

I. මාසය තුළ සමෘද්ධි බැංකුවට ලද රු.500,000/= ට වැඩි ණය ඉල්ලුම්පත්‍ර වලට අදාළ ව්‍යාපෘති වාර්තා හා බැංකු සමිතියට ලද ණය ඉල්ලුම්පත්‍රවලට අදාල ව්‍යාපෘති වාර්තා සකස් කිරීම, ව්‍යපෘති කළමනාකරු නොමැතිවිට ව්‍යාපෘති ඇගයීම් කිරීම, නිර්දේශ ලබා දිම, පෙර හා පසු විපරම් කිරීම

II. ජීවනෝපාය ව්‍යාපෘති ආරම්භ කිරීමට සහය වීම

III. පවුල් සවිබල ගැන්වීමේ ජාතික වැඩසටහනට අදාළව ව්‍යපෘති සකස් කිරීම සහය සේවා ආයතන සමග වැඩසටහන් සංවිධානය කිරීම

V. සෑම මාසයකම කල්පසු ණය 25 ක් හා බොල්ණය 5 ක් අධීක්ෂණය කිරීම හා කලාපය, ණයකරුගේ නම, ලිපිනය, ගිණුම් අංකය සහිතව නිරීක්ෂණ දිනට ප්‍රගතිය ඇතුළත්ව, සකස් කළ වාර්තාව මෙම දීමනාව අයදුම්කරන ඇමුණුම-3 ආකෘතියට අමුණා තැබිය යුතුය.

7.3 සමාජ සංවර්ධන නිලධාරීන්

i. අවම වශයෙන් මාසයකට මත් නිවාරණ වැඩසටහන් 02 බැගින් ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් පවත්වා තිබීම හා වාර්තා කිරීම.

ii. කැකුළු ළමා සමාජයන්හී ක්‍රියාකාරකම් සොයා බැලීමට අවම වශයෙන් ළමා සමාජ රැස්වීම් 02 ක් වත් සහභාගී වීම.

iii. ආගමික/සංස්කෘතික වැඩසටහන් ප්‍රාදේශිය /ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් මාසිකව පැවැත්වීම හා ඒ සඳහා සහය දක්වා තිබීම.

iv. ගෘහ කළමනාකරණ වැඩසටහන් මාසිකව අවම වශයෙන් 02 ක් වත් පැවැත්වීම

v. පාසල් යන වයසේ පාසල් නොයන දරුවන් පිළිබඳව සොයා බලා ඔවුන් පාසල් ගත කිරීම හා ඒ පිළිබඳ මාසික වාර්තා ලබා දීම.

vi. මනෝ සාමාජීය සවිබල ගැන්වීමට අදාළ තොරතුරු ඒකරාශී කිරීම හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

vii. ඉහත ආකාරයෙන්(i-vi) ඉටුකළ වැඩ ප්‍රමාණයන් පිළිබඳව කලාපය, ප්‍රතිලාභියාගේ නම, ලිපිනය, ගිණුම් අංකය සහිතව නිරීක්ෂණ දිනට ප්‍රගතිය ඇතුළත්ව, සකස් කළ වාර්තාවක් මෙම දීමනාව අයදුම්කරන ඇමුණුම-3 ආකෘතියට අමුණා තැබිය යුතුය.

08. කලාප සහකාර (ක්ෂේත්‍ර සහකාර) මාසික දීමනාව ලබා දීමේ දී බැංකු කළමනාකරු විසින් මාසිකව පවරන රාජකාරී වල්ට අනුව පහත දැ ඉටු කර ඇති බවට සොයා බැලීම සිදු කළ යුතුය. තවද බැංකුව මාසික දීමනාව ලබා ගැනීමට සුදුසුකම් සපුරා ඇත්නම් පමණක් මෙම නිලධාරියාටද දීමනාව ගෙවිය යුතුය.

I. සමෘද්ධි බැංකු ණය මුදලින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති පරීක්ෂා කර වාර්තා කර තිබීම
II. සමෘද්ධි බැංකු ණය කල්පසු/ පැහැර හැරි ණයකරුවන් හමුවට යෑම හා ණය ආපසු අය කර ගැනීමට කටයුතු කිරීම හා වාර්තා කර තිබීම.
III. කලාප රැස්වීම් වලට අදාළ වාර්තා හා ගොනු නඩත්තු කර තිබීම.
IV. සවිබල ගැන්වීම් වැඩසටහන යටතේ හඳුනා ගත් ප්‍රතිලාභි පවුල් පිළිබඳ පසුවිපරම් කිරීම.
V. සමෘද්ධි බැංකු/බැංකු සමිති ප්‍රගති රැස්වීම් වලට අදාළ තොරතුරු සකස් කිරීම හා ඉදිරිපත් කර තිබීම.
VI. බැංකුවේ ආරක්ෂාව හා බැංකු පරිශ්‍රය පිරිසිදුව තබා ගැනීමට බැංකු කළමනාකරුට සහය වී තිබීම.
VII. ප්‍රජාමූල සංවිධාන රැස්වීම් හා අනෙකුත් රාජකාරි කටයුතු වල නිරත වීම.
VIII. ආයතනික හා පරිපාලන කටයුතු සඳහා බැංකු කළමනාකරුට සහය වී තිබීම.
IX. ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ඉදිරි වැඩසටහන් කළ වැඩසටහන්, රාජකාරී බැහැර යාම් නිවාඩු නිවැරදිව නඩත්තු කරවීම.
X. කුඩා කණ්ඩායම් පොදු මුදල් පොත් පරීක්ෂාව හා නිවැරදිතාවය තහවුරු කිරීම
XI. සෑම මාසයකම කල්පසු ණය 25 ක් හා බොල්ණය 5 ක් අධීක්ෂණය කිරීම හා ණයකරුගේ නම, ලිපිනය, ගිණුම් අංකය සහිතව නිරීක්ෂණ දිනට ප්‍රගතිය ඇතුළත්ව, සකස් කළ වාර්තාව මෙම දීමනාව අයදුම්කරන ඇමුණුම-1 ආකෘතියට අමුණා තැබිය යුතුය.

09. උපයා ගත යුතු කොන්දේසි ඒ ඒ මාසයේ දී සම්පූර්ණ නොකොට පසුව සම්පූර්ණ කර දීමනා ලබා ගත නොහැක. එහෙත් යම් විශේෂිත තත්ත්වයකදී පෙර මාසවල දීමනා ලබා ගැනීමට දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගේ නිර්දේශය සහිතව බැංකු මූලා අධ්‍යක්ෂකගේ අනුමැතිය ලබාගෙන ප්‍රවර්තන මූලා වර්ෂයට ලබාගත හැකිය. දෙසැම්බර් මාසයේ දීමනාව පමණක් අදාළ පෝරම වලට අනුමැතිය ලබා ගැනීමෙන් පසු එළඹෙන වර්ෂයේ ජනවාරි මාසයේ දී ගිණුම්වලට බැර කර දීමනා ලබා ගැනීමට අවසර ලබා දේ.

10. වැඩ බලන/ වැඩ ආවරණය කරන නිලධාරීන්ට විශේෂ මාසික දීමනාව ලබා දීම.

බැංකු හා බැංකු සමිතිවල, පුරප්පාඩු තනතුරුහී වැඩ බලන/ වැඩ ආවරණය කරන නිලධාරියෙකු නීත්‍යානුකූලව පත්කර ඇති විටෙක ඔහුට/ ඇයට මෙම මාසික දීමනාව ගෙවිය යුතුය. එලෙස ගෙවිය හැක්කේ නිත්‍ය තනතුරට අමතරව, එක් වැඩබලන තනතුරකට අදාළ දීමනාව පමණි.

11. මාසික දීමනාවට අදාළ නිර්ණායක/කොන්දේසි සම්පූර්ණ කර ඇති බවට තහවුරු කර ලබා දීම පහත නිලධාරීන් විසින් කළ යුතුය.

විස්තරය	සහතිකය ලබා දීමට භාවිතා කළ යුතු ආකෘතිය	තහවුරුව ලබා ගත යුතු දිනය	තහවුරුව ලබා දෙන නිලධාරියා
සමෘද්ධි බැංකුව	ඇමුණුම 01	එළඹෙන මාසයේ 20 දිනට පෙර	බැංකු සමිති කළමනාකරු
කලාප සහකාර (ක්ෂේත්‍ර)	ඇමුණුම 01 හා චක්‍රලේඛයේ 8 ඡේදය තහවුරු කිරීමේ ලේඛණ	එළඹෙන මාසයේ 20 දිනට පෙර	බැංකු කළමනාකරු
ක්ෂේත්‍රගත සමෘද්ධි සංවර්ධන නිලධාරීන්	ඇමුණුම 02	එළඹෙන මාසයේ 15 දිනට පෙර	බැංකු කළමනාකරු
සමෘද්ධි බැංකු සමිතිය	ඇමුණුම 03	එළඹෙන මාසයේ 20 දිනට පෙර	දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ
ව්‍යාපෘති කළමනාකරු	ඇමුණුම 03 හා චක්‍රලේඛයේ 7.1 ඡේදය තහවුරු කිරීමේ ලේඛණ	එළඹෙන මාසයේ 20 දිනට පෙර	බැංකු සමිති කළමනාකරු
ව්‍යාපෘති සහකාර	ඇමුණුම 03 හා චක්‍රලේඛයේ 7.2 ඡේදය තහවුරු කිරීමේ ලේඛණ	එළඹෙන මාසයේ 20 දිනට පෙර	බැංකු සමිති කළමනාකරු
සමාජ සංවර්ධන සහකාර	ඇමුණුම 03 හා චක්‍රලේඛයේ 7.3 ඡේදය තහවුරු කිරීමේ ලේඛණ	එළඹෙන මාසයේ 20 දිනට පෙර	බැංකු සමිති කළමනාකරු

යම් සමෘද්ධි බැංකු කළමනාකරුවෙකු බැංකු සමිතියක හෝ බැංකු සමිතියක කළමනාකරුවෙකු සමෘද්ධි බැංකුවක වැඩ බලන විටක තහවුරුව මූලස්ථාන කළමනාකරුවෙකුගෙන් ලබා ගත යුතු වේ. බැංකු සමිති කළමනාකරු, ව්‍යාපෘති කළමනාකරු ලෙස වැඩ බලන විට මූලස්ථාන කළමනාකරුගෙන් ද මූලස්ථාන කළමනාකරුවකු නොමැති නම් දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගෙන් තහවුරුව ලබාගත යුතුය.

12. දීමනා ගෙවීමට අදාළ ගිණුම් සටහන

ලබා දෙන දීමනාව නිලධාරින්ගේ පුද්ගලික සාමාජික නොවන/දිරියමාතා/ශ්‍රම ශක්ති ඉතුරුම් ගිණුමක් හරහා ලබා දීම කළ යුතුය.ඒ සඳහා ගිණුම් සටහන පහත පරිදි වේ.

<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකුව</u>

වැය ගිණුම - කාර්ය මණ්ඩල දීමනා හා ගමන් වියදම් ගිණුම - හර (කේත අංක 2113)

දිරියමාතා /සාමාජික නොවන ඉතිරි කිරීමේ ගිණුම - බැර

<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය</u>

වැය ගිණුම - කාර්යය මණ්ඩල දීමනා හා ගමන් වියදම් ගිණුම - හර (කේත අංක 6203)

ශ්‍රම ශක්ති ඉතුරුම් ගිණුම - බැර

13. සති අන්ත දින වල රාජකාරී වල නිරත වීම හා දින වැටුප් ලබා ගැනීම.

සමෘද්ධි බැංකුවට මාසයකට උපරිම සති අන්ත/ රජයේ නිවාඩු දින 03 ක් රාජකාරී කළ හැක. දින වැටුප් සමෘද්ධි බැංකු අරමුදලින් ලබා ගත යුතුය. සති අන්ත/ රජයේ නිවාඩු දින වල ඉටු කළ යුතු රාජකාරී පහත පරිදි වේ.

13.1 ප්‍රගති වාර්තා සකස් කිරීම හා සමාලෝචනය - පළමු සති අන්ත සෙනසුරාදා/ ඉරිදා

13.2 අනෙකුත් සති අන්ත/ රජයේ නිවාඩු දින වල

- I. ඉතුරුම් ප්‍රවර්ධනයට අදාළ වැඩසටහන් හඳුනා ගැනීම සැළසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- II. අක්‍රීය ගිණුම් හිමියන් හා කොටස් මුදල සම්පූර්ණ නොකරන ලද පුද්ගලයින් හඳුනා ගෙන සක්‍රීය කොටස්කරුවන්/ගිණුම් හිමියන් බවට පත් කිරීමට අදාළ කටයුතු කිරීම.
- III. අස්වැසුම සවිබල ගැන්වීම් වැඩසටහන යටතේ සවිබල ගැන්වීම සඳහා හඳුනාගත් ප්‍රතිලාභීන්ගේ නාම ලේඛණ ගොනු සකස් කිරීම ආදායම් උත්පාදන ව්‍යාපෘති හඳුනා ගැනීම ණය ප්‍රදානයට සුදුසුකම් සම්පූර්ණ කිරීම.
- IV. සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ මානසික හා සාමාජීය සවිබල ගැන්වීමේ ක්ෂේත්‍රයන්ට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- V. බොල් ණය /කල්පසු ණය ආපසු අය කර ගැනීමට අදාළ රාජකාරී
- VI. සමෘද්ධි බැංකු ණය මුදා හැරීම් වලට අදාළ ගොනු සකස් කිරීම හා ඉදිරි සැළසුම් සම්බන්ධ රාජකාරී වල නිරත වීම.
- VII. ඉදිරි මාසයේ / කාර්තු වල ණය ක්‍රියාකාරී සැළසුම් සකස් කිරීමේ රාජකාරී
- VIII. සමෘද්ධි බැංකු ප්‍රගති රැස්වීම් බැංකු සමිති ප්‍රගති රැස්වීම් පාලක මණ්ඩල රැස්වීම් වලට අදාළ වාර්තා හා ගොනු පිළියෙළ කිරීමේ රාජකාරී වල නිරත වීම.
- IX. බැංකු පරිශ්‍රයේ අභ්‍යන්තර/බාහිර අරක්ෂාව හා පිරිසිදු කිරීමේ රාජකාරි
- X. මෘදුකාංගය මඟින් ඉතුරුම් තැන්පතු පොළි බැර කිරීම් පරිගණක මෘදුකාංගයට අදාළව පැවරෙන විශේෂ රාජකාරි සිදු කිරීම (සති අන්ත/රජයේ නිවාඩු වලට යෙදෙන අවස්ථාවේ දී)

13.3 ගමන් වියදම්, අතට පාඩු /අතිකාල සම්බන්ධව දැනට ලබා දී ඇති උපදෙස් අනුව කටයුතු කරන ලෙසත්, ඒ සඳහා ප්‍රජාමූල බැංකු / බැංකු සමිති සඳහා මූල්‍ය පාලනය හා මූල්‍ය සීමාවන් පිළිබඳ බලතල පැවරීමේ චක්‍රලේඛයේ උපදෙස් පිළිපැදිය යුතුය. එමෙන්ම රාජකාරී සඳහා පැමිණීමට පූර්ව අනුමැතිය බැංකුවක් නම් බැංකු සමිති කළමනාකරුගෙන් ද, බැංකු සමිතියක් නම් දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂක/ නියෝජ්‍ය අධ්‍යක්ෂක/ සහකාර අධ්‍යක්ෂක වෙතින් ද ලබා ගත යුතුය.

13.4 යතුරු ධාරක දීමනා සම්බන්ධයෙන් නිකුත් කර තිබූ 2024/10 චක්‍රලේඛය මෙමගින් අවලංගු කර ඇති බැවින් යතුරුධාරක දීමනා පහත ආකාරයෙන් ලබා ගත යුතුය.

තනතුර	බැංකුව	බැංකු සමිතිය
කළමනාකරු (බැංකු හා බැංකු සමිති)	1500/-	1250/-
සහකාර කළමනාකරු	1500/-	1250/-
මුදල් අයකැමි	1500/-	1250/-

සී.ඩී.කළුආරච්චි.
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :-

1. ලේකම් - ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ, සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.පි.
2. දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.පි./අ.ක.ස.
3. ප්‍රධාන ගණකාධිකාරී - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
5. සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. කා.දැ.පි./අ.ක.ස.
6. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - අ.ක.ස.
7. ප්‍රාදේශීය ලේකම් - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - කා.දැ.පි./අ.ක.ස.
8. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.
9. සභාපති - සමෘද්ධි ප්‍රජාමූල බැංකු මහා සංගමය කා.දැ.පි./අ.ක.ස.

ඇමුණුම-A(බැංකු නිළධාරී දීමනා ඉල්ලීම)

සමෘද්ධි බැංකු මාසික දීමනා ලබාගැනීම

සමෘද්ධි බැංකුව:- වර්ෂය/මාසය :-

1	2	3	4	5	6	7	8	9	**10**
දීමනා විස්තරය	දීමනා තත්ත්වය/ අනුපාතය	කළමනාකරු	සහකාර කළමනාකරු	පොත් තබන්නා	ගිණුම් ලිපිකරු-I	ගිණුම් ලිපිකරු -II (ණය)	ගිණුම් ලිපිකරු-III (ණය)	කලාප/ ක්ෂේත්‍ර සහකාර	**එකතුව**
අවදානම් දීමනාව (4.1)									
ශුද්ධ ලාභය (4.2.1)									
ණය තැන්පත් අනුපාතය (4.2.2.1)									
බොල්ණය අනුපාතය (4.2.3)									
කල්පසු ණය අනුපාතය (4.2.4)									
තැන්පත් වර්ධණය (4.2.5)									
එකතුව									
නිළධාරියාගේ නම									
අත්සන									

සකස් කළ අයගේ	පරීක්ෂා කළ අයගේ	කළමනාකරුගේ	බැංකු සමිති කළමනාකරුගෙන් අනුමැතිය ලද දිනය:
නම:	නම:	නම:	
තනතුර:	තනතුර:	අත්සන:	
අත්සන:	අත්සන:	දිනය:	ආකෘති-1 හා අනෙකුත් ඇමුණුම් මෙම පෝරමයට අමුණා ඇත
දිනය:	දිනය:	මුද්‍රාව	

සැ/යු:

මෙම චක්‍රලේඛය සමග සපයා ඇති Mx-Excell වැඩසටහන මගින් එක් එක් නිළධාරියාට හිමි මාසික දීමනා මුදල ඇමුණුම-1 මගින් ලබා දෙන අතර, එම දීමනා උපයෝගී කරගෙන මෙම ආකෘතිය ඉහත ආකාරයෙන් සම්පූර්ණ කරගත යුතුය. වියදම් අනුමැතිය / ආවරණ අනුමැතිය පාලක මණ්ඩලයෙන් ලබාගෙන එක් පිටපතක් මාසික දීමනා ගොනුවේ බහා තැබිය යුතු අතර, තවත් පිටපතක් වවුචරය සමග අමුණා තැබීම ද කළ යුතුය.

ඇමුණුම-B (ක්ෂේත්‍ර නිළධාරී දීමනා ඉල්ලීම)

සමෘද්ධි බැංකු ක්ෂේත්‍ර කාර්යමණ්ඩල මාසික දීමනා ලබාගැනීම

සමෘද්ධි බැංකුව:- වර්ෂය/මාසය :-

	1	2	3	4	5	6	7	8	9	10
	ක්ෂේත්‍ර සමෘද්ධි සංවර්ධන නිළධාරියාගේ නම	අවදානම් දීමනාව (4.1)	ශුද්ධ ලාභය (4.2.1)	ණය - තැන්පත් අනුපාතය (4.2.2.2)	බොල්ණය අනුපාතය (4.2.3)	කල්පසු ණය අනුපාතය (4.2.4)	තැන්පත් වර්ධණය (4.2.5)	විශේෂ දීමනාව (4.2.6)	එකතුව	අත්සන
	දීමනා තත්ත්වය/ අනුපාතය									
1										
2										
3										
4										
5										
6										
7										
8										
9										
10										
11										
12										

සකස් කළ අයගේ	පරීක්ෂා කළ අයගේ	කළමනාකරුගේ	පාලක මණ්ඩල අනුමැතිය/ ආවරණ
නම:	නම:	නම:	
තනතුර:	තනතුර:	අත්සන:	අනුමැතිය ලද දිනය: 20
අත්සන:	අත්සන:	දිනය:	ආකෘති-2 හා අනෙකුත් ඇමුණුම් මෙම පෝරමයට අමුණා ඇත
දිනය:	දිනය:	මුද්‍රාව	

සැ/යු: මෙම චක්‍රලේඛය සමග සපයා ඇති Mx-Excell වැඩසටහන මගින් එක් එක් නිළධාරියාට හිමි මාසික දීමනා මුදල ඇමුණුම්-2 මගින් ලබා දෙන අතර, එම දීමනා උපයෝගී කරගෙන මෙම ආකෘතිය ඉහත ආකාරයෙන් සම්පූර්ණ කරගත යුතුය. වියදම් අනුමැතිය / ආවරණ අනුමැතිය පාලක මණ්ඩලයෙන් ලබාගෙන එක් පිටපතක් මාසික දීමනා ගොනුවේ බහා තැබිය යුතු අතර, තවත් පිටපතක් වවුචරය සමග අමුණා තැබීම ද කළ යුතුය.

ඇමුණුම-C (බැංකු සමිති නිළධාරී දීමනා ඉල්ලීම)

සමෘද්ධි බැංකු සමිති මාසික දීමනා ලබාගැනීම

සමෘද්ධි බැංකු සමිතිය:- වර්ෂය/මාසය :-

1	2	3	4	5	6	7	8	9	**10**
දීමනා විස්තරය	දීමනා තත්වය/ අනුපාතය	කළමනාකරු	ව්‍යාපෘති කළමනාකරු	සහකාර කළමනාකරු	ආයතන සහකාර	ගිණුම්/මුදල් සහකාර	ව්‍යාපෘති සහකාර	සමාජ සංවර්ධන නිළධාරී	**එකතුව**
ලාභය අනුව දීමනාව (5.1)									
ශුද්ධ ලාභය (5.3.1)									
මුළු පිටහිටි ණය (5.3.2)									
අක්‍රීය (බොල්)ණය අනුපාතය (5.3.3)									
කල්පසු ණය අනුපාතය (5.3.4)									
එකතුව									
නිළධාරියාගේ නම									
අත්සන									

සකස් කළ අයගේ	පරීක්ෂා කළ අයගේ	කළමනාකරුගේ	දිස්ත්‍රික් අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ ගෙන්
නම:	නම:	නම:	
තනතුර:	තනතුර:	අත්සන:	අනුමැතිය ලද දිනය: 20
අත්සන:	අත්සන:	දිනය:	ආකෘති-3 හා අනෙකුත් ඇමුණුම් මෙම පෝරමයට අමුණා ඇත
දිනය:	දිනය:	මුද්‍රාව	

සැ/යු:

මෙම චක්‍රලේඛය සමග සපයා ඇති Mx-Excell වැඩසටහන මගින් එක් එක් නිළධාරියාට හිමි මාසික දීමනා මුදල ඇමුණුම-3 ආකෘතිය ලබා දෙන අතර, එම දීමනා උපයෝගී කරගෙන ඉහත ආකාරයෙන් මෙම ආකෘතිය සම්පූර්ණ කරගත යුතුය. වියදම්අ නුමැතිය / ආවරණ අනුමැතිය විධායක කමිටුවෙන් ලබාගෙන එක් පිටපතක් මාසික දීමනා ගොනුවේ බහා තැබිය යුතු අතර, තවත් පිටපතක් වවුචරය සමග අමුණා තැබීම ද කළ යුතුය.